GICHD



# ශ්‍රී ලංකාවේ බෝම්බ ඉවත් කිරීම සඳහා කාන්තාවන් සේවයට ගැනීමේ සමාජ ආර්ථික බලපෑම්

## මූලික සොයා ගැනීම්

මානුෂීය බෝම්බ ඉවත් කිරීම සඳහා වන ජිනීවා අන්තර්ජාතික මධ්‍යස්ථානය
ශ්‍රී ලංකාවේ බෝම්බ ඉවත් කිරීම සඳහා කාන්තාවන් සේවයට ගැනීමේ සමාජ ආර්ථික බලපෑම් මූලික සොයා ගැනීම්, GICHD, ජිනීවා, 2020 ජූනි
© GICHD

මෙම අධ්‍යයනය සිදු කරන ලද්දේ GICHD මධ්‍යස්ථානයේ මැරියන් ප්‍රෝවෙන්චර් සහ ලෝරා බිස්කාග්ලියා (Marion Provencher and Laura Biscaglia) විසිනි.

මෙම ප්‍රකාශනය පළ කිරීම පිණිස ලබා දුන් මූල්‍ය සහාය වෙනුවෙන්  කැනඩා රජයට ස්තූතිය පිරිනැමේ.

මෙම ප්‍රකාශනයේ අන්තර්ගතයෙන්, එහි ඉදිරිපත් කිරීම මගින් සහ සේවානියුක්ත කරන ලද තනතුරුවලින් කිසියම් රටක, දේශසීමාවක හෝ සන්නද්ධ කණ්ඩායමක, හෝ එහි යුද පෙරමුණුවලින් හෝ දේශසීමාවලින් හමුදාව ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් මානුෂීය බෝම්බ ඉවත් කිරීම සඳහා වන ජිනීවා අන්තර්ජාතික මධ්‍යස්ථාන පාර්ශ්වයෙන් වන කිසිදු මත ප්‍රකාශ කිරීමක් සිදු නොවේ. සියලුම අන්තර්ගත සම්බන්ධයෙන් වන පරම වගකීම GIGHD විසින් දරනු ලැබේ.

# අධ්‍යයනය

මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ කාන්තා සහ පිරිමි බෝම්බ ඉවත් කරන්නන් සේවා නියුක්ත කිරීමේ සමාජ ආර්ථික බලපෑම් සලකා බලනු ලැබේ. ජාතික බෝම්බ පිළිබඳ ක්‍රියාකාරී මධ්‍යස්ථානයේ (NMAC), රටේ හවුල්කරුවන්ගේ (HALO භාරය, බෝම්බ උපදේශක කණ්ඩායම, SHARP සහ DASH), සහායට ස්තුතිවන්නට, බෝම්බ ඉවත් කරන්නන් 226ක් (කාන්තාවන් 113ක් සහ පුරුෂයින් 113ක්) සමීක්ෂණයට භාජනය කරන ලද අතර, පවුල් 103ක් සහ ප්‍රජා සාමාජිකයින් (කාන්තාවන් 69 සහ පුරුෂයින් 34ක්) සම්මුඛ සාකච්ඡා සඳහා යොදවා ගන්නා ලදි. බෝම්බ ඉවත් කරන්නන් සමග තනි පුද්ගල වශයෙන් සාකච්ඡා 13ක් (කාන්තාවන් 9ක් සහ පුරුෂයින් 4ක්) සිදු කරන ලදි.

ඔවුන්ට සම්පත් සතු කර ගැනීමේ සහ සේවා වෙත පිවිසීමේ හැකියාව වැනි, තම ජීවිතවලට බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් සිදු කර ඇති වෙනස්කම් සම්බන්ධයෙන් කාන්තාවන්ගෙන් සහ පුරුෂයින්ගෙන් අදහස් ලබා ගන්නා ලදි. මෙම අධ්‍යයනය මගින් කාන්තාවන්ගේ ස්වයං අවබෝධයේ සහ පවුල් සහ ප්‍රජා මට්ටමින් තීරණ ගැනීමේ හැකියාවේ පවත්නා විචලතාවයන් සම්බන්ධයෙන් ගවේෂණය කරන ලදි. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වැඩ මුර අනුව සේවය කරන කාන්තාවන් සම්බන්ධයෙන් අදාල මෙන්ම, දේශීය සන්දර්භය තුළ පුළුල් ස්ත්‍රී පුරුෂ සම්මත පිළිබඳ ඔවුන්ගේ ආකල්ප එක්රැස් කිරීම සඳහා අදාල පවුල් සහ ප්‍රජා සාමාජිකයන් සම්මුඛ සාකච්ඡා සඳහා යොදා ගන්නා ලදි.

# සංදර්භය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සිවිල් යුද්ධය අවසන්ව අවුරුදු 10කටත් වඩා වැඩි කාලයක් ගත වී තිබේ. ශ්‍රී ලංකා රජය දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය පරාජය කර ජයග්‍රහණය ලබා ගත් බවට ප්‍රකාශ කිරීමෙන් අනතුරුව දශක තුනකට (1983-2009) අධික කාලයක් තුළ පැවති සන්නද්ධ අරගලය නිමා විය.[1]

සිවිල් යුද්ධයෙන් අනතුරුව, ශ්‍රී ලංකාව වේගවත් ආර්ථික පුනරුදයක් සහ ස්ථාවර වර්ධනයක් අත්පත් කර ගත් අතර එයින් රටේ ජනතාවගේ ආර්ථික සුභසිද්ධිය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති විය. කෙසේ වෙතත්, යුද්ධය හේතුවෙන් රටේ උතුරු-නැගෙනහිර පළාත් පුපුරණ ද්‍රව්‍ය හේතුවෙන් විශාල වශයෙන් දූෂණය වී තිබේ. ඉඩම් නිදහස් කිරීමේ ප්‍රයත්නවලින් මෙම බොහොමයක් දූෂණ ඉවත් කර තිබෙන අතර, 2010 දී දූෂණය වී තිබූ ඉඩම් වර්ග කිලෝමීටර 506 ක ප්‍රමාණය 2018 වන විට 25.8[2] දක්වා අඩු කර ගෙන තිබේ.[2] 2017 ජූනි මාසයේ දී, නැගෙනහිර පළාතේ මඩකලපුව, බිම් බෝම්බවලින් තොර බවට ප්‍රකාශ කළ ප්‍රථම දිස්ත්‍රික්කය විය.[3] 2020 වර්ෂයේ ආරම්භය වන විට, ශ්‍රී ලංකාව, විශේෂයෙන්ම නැගෙනහිර පළාත තවදුරටත් පුපුරණ ද්‍රව්‍යවල දූෂණයේ බලපෑමට ලක් වී තිබේ.[4]

මෙම පළාත තුළ සමාජ ආර්ථික සංවර්ධනය කෙරෙහි පුපුරණ ද්‍රව්‍යවල දූෂණයෙන් සිදු වන බලපෑම ඉතා විශාල වේ.[5] දූෂණය හේතුවෙන් නැවත පදිංචි වන සහ අභ්‍යන්තරික වශයෙන් අවතැන් වන පුද්ගලයින්ගේ (IDPs) සහ සරණාගතයන්ගේ ආපසු පැමිණීමේ ඉඩප්‍රස්ථා සීමා කර ඇති අතර, එමගින් පදිංචිකරුවන්ට සිය ජීවිකා වෘත්තීන් සිදු කර ගෙන යාමටත් මූලික සේවා සහ යටිතල පහසුකම් වෙත පිවිසීම සඳහා වන හැකියාව සඳහාත් බාධා ඇති වී තිබේ. අවුරුදු තිහකට ආසන්න කාලයක් තිස්සේ දැනටමත් දැඩි බලපෑමට ලක් වී ඇති රටේ කොටසක, විශාල පරිමාණයෙන් පුපුරණ ද්‍රව්‍ය  තිබීම මගින් තිරසාර ආර්ථික පුනරුදය මෙන්ම පළාතේ ජනතාවගේ සංවර්ධනය සඳහා වන ඉඩප්‍රස්ථා ද තව දුරටත් අවහිර කෙරේ.

1 බිම් බෝම්බ දර්ශකය. ශ්‍රී ලංකාව: බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්. 2019.

2 බිම් බෝම්බ දර්ශකය. ශ්‍රී ලංකාව: බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්. 2019.

3 බෝම්බ පිළිබඳ උපදේශන කණ්ඩායම. MAG බෝම්බ ඉවත් කරන්නන්ට ස්තූති වන්නට, ශ්‍රී ලංකාව බිම්බෝම්බවලින් තොර ප්‍රථම දිස්ත්‍රික්කය ප්‍රකාශයට පත් කරයි. 2017.

4 බිම් බෝම්බ දර්ශකය. ශ්‍රී ලංකාවේ පැතිකඩ. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්ක්‍රියාකාරකම්. 2019.

5 මෙම පත්‍රිකාවේ සමාජ ආර්ථික සංවර්ධනය අර්ථ දක්වා ඇත්තේ ආර්ථික සහ සමාජ ප්‍රගතිය අනුව, තනි පුද්ගලයින්ගේ, පවුල්වල සහ ප්‍රජාවල ජීවන තත්ව සහ යහසාධනය වැඩිදියුණු කර ගැනීමේ ක්‍රියාවලිය ලෙසට වේ.  ආදායමේ වැඩිවීම, සම්පත් සඳහා වන වර්ධිත ප්‍රවේශය, සහ අධ්‍යාපනය සහ තාක්ෂණය වෙත තිබෙන වැඩිදියුණු වූ ප්‍රවේශය හා අදාල විවිධ දර්ශක අනුව එය මනිනු ලැබේ. පරිශීලනය.IGI Global. සමාජ ආර්ථික සංවර්ධනය. 2020.

මෙම සංදර්භය තුළ, බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම් පුද්ගලයින්ගේ මූලික ආරක්ෂණ අවශ්‍යතා සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වනවා පමණක් නොව බලපෑමට ලක් වූ ප්‍රජාවල පුනරුදය සහ ප්‍රගතිය සම්බන්ධයෙන් වන ප්‍රධාන ප්‍රවර්ධකයක් ලෙස ද ක්‍රියා කරනු ඇත.[6] පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම මගින් ඵලදායි භාවිතයට, නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනයට ඉඩම් නැවත ලබා දීමට ඉඩ සලසා, තිරසාර ජීවිකා වෘත්තියක් නැවත ඇති කරන බැවින් ද කාන්තාවන්, ගැහැණු ළමුන්, පිරිමි ළමුන් සහ පුරුෂයින්හට ආරක්ෂිත පරිසරයක ජීවත් වීමට, වැඩ කිරීමට, සහ දියුණු වීමට දායක වන බැවින් ද පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම සමාජ ආර්ථික සංවර්ධනයේ පූර්ව කොන්දේසියක් වේ. ඒ අතරම, බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් මෙහෙයුම් ප්‍රදේශවල රැකියා අවස්ථා උත්පාදනය කෙරේ. විශේෂයෙන්ම කාන්තාවන් සඳහා, වෘත්තීය අවස්ථාවන් හිඟ උතුරු පළාත තුළ යෝග්‍ය රැකියාවක් සඳහා වන ප්‍රවේශය විශේෂ වශයෙන් පරිවර්තනාත්මක සාධකයක් වේ.

6 මාස්ලෝගේ අවශ්‍යතාවල ධූරාවලිය අනුව, ආරක්ෂණ අවශ්‍යතා යන්නට නිවාස සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර වීම, සහ ස්ථාවර පරිසරයක් වැනි භෞතික ආරක්ෂාව ඇතුළත් වේ. මනෝවිද්‍යාත්මක විග්‍රහය.

# ශ්‍රී ලංකාවේ බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්

ජාත්‍යන්තර සහ ජාතික ක්‍රියාකාරුවන් ශ්‍රී ලංකාවේ පුපුරණ ද්‍රව්‍ය ඉවත් කිරීම මුල් වරට ආරම්භ කළ දින සිට දස වසරකට වඩා ගත වී ඇති අතර, එයින් රටේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙසෙන ශ්‍රී ලාංකීය කාන්තාවන් සහ පුරුෂයින් සඳහා රැකියා අවස්ථා නිර්මාණය වී තිබේ. පොළොව මතුපිට ඇති සියලු බෝම්බ හා අදාල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණ මෙහෙයුම් ආයතනය වන්නේ NMAC වේ.[7] 2020 වන විට, බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම් පහත දැක්වෙන ආයතන මගින් සිදු කරනු ලැබේ:

| මෙහෙයුම්කරුවන්ගේ ස්වභාවය | මෙහෙයුම්කරුගේ නම |
|---|---|
| ජාතික | ශ්‍රී ලංකා යුද හමුදාව (SLA) |
| රාජ්‍ය නොවන සංවිධාන (NGOs) | DASH<br>SHARP |
| ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන | HALO භාරය<br>බෝම්බ පිළිබඳ උපදේශන කණ්ඩායම (MAG) |

ශ්‍රී ලංකා යුද හමුදාව හැර, අනෙකුත් සියලු ආයතන ඉතිහාසයේ දී විවිධ කාන්තාවන් සේවා නියුක්ත කර තිබේ.[8] ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාව සතුව ලෝකයේ බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම්වල නිරතව සිටින කාන්තා පුරුෂ අනුපාතය ඉහළ අගයක් ගනී.[9] මුළු වශයෙන්, පර්යේෂණය සිදු කෙරෙන අවස්ථාව වන විට, මෙහයුම්කරුවන් හතර දෙනා විසින් 1,882ක් (පුරුෂයින් 1,356ක් සහ කාන්තාවන් 526ක් වශයෙන්) සේවා නියුක්ත කර තිබුණි. අධ්‍යයනය සිදු කරන අවස්ථාවේ දී සම්මුඛ සාකච්ඡාවට භාජනය කරන ලද මෙහෙයුම්කරුවන් අතර බෝම්බ ඉවත් කරන කාන්තාවන්ගේ අනුපාතය 39%ක් විය.

7 ශ්‍රී ලංකාවේ ජාතික බෝම්බ හා ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ වැඩසටහන. 2020 මාර්තු මාසයේ දී අදහස් ලබා ගන්නා ලදි.

8 පර්යේෂණය සිදු කරන අවස්ථාව වන විට, HALO භාරය සතුව 692ක (කාන්තාවන් 322, පුරුෂයින් 370) කාර්ය මණ්ඩලයක් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල නිරතව සිටි අතර ඒ අනුව මුළු කාන්තා ප්‍රතිශතය 47%ක් විය. MAG ආයතනය ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන කාර්යභාරයක් දැරූ අතර එම ආයතනය සතුව කාන්තාවන් 79ක් සහ පුරුෂයන් 564ක් විය. ජාතික NGO DASH සතුව 422ක (කාන්තාවන් 110, පුරුෂයින් 312), මණ්ඩලයක් සිටි අතර SHARP සතුව සේවකයින් 125ක් (කාන්තාවන් 15, පුරුෂයින් 110) විය.

9 පර්යේෂණය සිදු කරන අවස්ථාව වන විට, බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම්වල පමණක්, බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරතව සිටි අයවළුන් අතරින් 39%ක් කාන්තාවන් විය.

## සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වූවන්ගේ සංයුතිය

දත්ත එකතු කරන අවස්ථාව වන විට, බෝම්බ ඉවත් කරන කාන්තාවන් සහ පුරුෂයින් යන දෙපාර්ශ්වයම සාමාන්‍ය වශයෙන් ක්ෂේත්‍රයේ වසර හතරක් සේවය කර ඇත. පුරුෂයින් 10%ට සාපේක්ෂව කාන්තාවන් 15%ක් තමන්ට ආබාධයක් ඇති බව පැවසූ අතර, කාන්තා බෝම්බ ඉවත් කරන්නියන් දෙදෙනෙක් තමන් බිම් බෝම්බවලින් ජීවිතය ගලවා ගත් අය බව පැවසූහ.


එකතු කරන ලද දත්ත අනුව බෝම්බ ඉවත් කරන කාන්තාවන් 50%ක් සිය ගෙවල්වල එකම ආදායම් උපයන්නියෝ වූහ. දහ දෙනකුගෙන් නව දෙනෙක් සිය සහකරුට වඩා උපයන බව වාර්තා කළහ. මෙයින් හැඟෙන්නේ බෝම්බ ඉවත් කරන කාන්තාවන්ගෙන් බහුතරය සමීක්ෂණය සිදු කරන කාලය තුළ සිය ගෙවල්වල මූලික ආදායම් උපයන්නියන් වූ බවයි.

බෝම්බ ඉවත් කරන කාන්තාවන් මූලික ආදායම් උපයන්නියන්





බෝම්බ ඉවත් කරන කාන්තාවන් තුන් දෙනකුගෙන් එක් අයකුට වඩා අදාල ක්‍රියාවලියට සම්බන්ධ වීමට පෙර කිසිම ආදායමක් නොතිබූ අතර පිරිමි සම්බන්ධයෙන් එය 20 දෙනෙකුගෙන් එක් අයෙකු විය. කාන්තාවන්ගේ සාමාන්‍ය වැටුප මාසයට රු. 9,580 සිට රු. 34,447 දක්වා වැඩි වූ අතර මෙය 3.5 ගුණයකට වැඩි වාර්ෂික වැටුප් වැඩි වීමක් විය. පිරිමින්ගේ සාමාන්‍ය වැටුප මාසයට රු. 19,455 සිට රු. 33,824 දක්වා වැඩි වූ අතර මෙය 1.7 ගුණයකට වැඩි වාර්ෂික වැටුප් වැඩි වීමක් විය.

ආදායමක් සහිත බෝම්බ ඉවත් කරන්නන්
බිම් බෝම්බ සම්බන්ධ සේවයේ යෙදීමට පෙර සහ පසු





සේවයේ යෙදීමට පෙර සහ පසුව බෝම්බ ඉවත්
කරන අයගේ මාසික වැටුප ශ්‍රී ලංකා රුපියල් වලින්



## සම්පත් හා සේවා සඳහා වැඩි වූ ප්‍රවේශය හා හිමිකාරීත්වය


සම්පත් හා සේවා සඳහා වැඩි වූ ප්‍රවේශය හා හිමිකාරීත්වය බිම් බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා බලපෑ හැකිය.

බෝම්බ ඉවත් කරන්නන් විසින් වාර්තා කරන අත්පත් කර ගත් සම්පත්





කාන්තා සහ පුරුෂ බෝම්බ ඉවත් කරන පුද්ගලයින් පස් දෙනෙකුගෙන් එක් අයෙකුට නිවසක් මිලට ගැනීමට හැකි වී තිබේ; පුරුෂයින් තුනෙන් එකකටත් කාන්තාවන් දෙකෙන් එකකටත් දේපලක් අත්පත් කර ගැනීමට හැකි වී තිබේ. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල යෙදෙන පිරිසෙන් භාගයකටත් වඩා වැඩි දෙනෙකුට, කෙලින්ම සිය රැකියාව හේතුවෙන් සිය නිවෙස් වෙත විදුලිබලය ලබා ගත හැකි වී තිබුණි. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ලැබුණු ආදායමට ස්තූති වන්නට වෙනත් ආකාරවල මිලට ගැනීම්ද සිදු කර තිබු අතර, ඒවායින් වඩාත් අවධානයට ලක් වූ ඒවා වූයේ ජංගම දුරකථන සහ මෝටර් බයිසිකල් වේ. බෝම්බ ඉවත් කරන කාන්තා සහ පුරුෂ දෙපාර්ශ්වයම වාර්තා කළේ සිය මූල්‍ය සේවා වෙත ප්‍රවේශයේ වර්ධනයක් ඇති වූ බවය. කාන්තාවන්ගෙන් 42%ක් සහ පුරුෂයින්ගෙන් 37%ක් බැංකු ගිණුම් වෙත ප්‍රවේශය ලබා ගෙන තිබුණි; කාන්තාවන්ගෙන් 42%ක් ණය ලබා ගෙන තිබූ බවට වාර්තා කර තිබුණි.

සම්පත් සඳහා වැඩි ප්‍රවේශයක් තිබෙන බව වාර්තා කළ බෝම්බ ඉවත් කරන්නන්





පුරුෂ බෝම්බ ඉවත් කරන්නන් පස් දෙනෙකුගෙන් තුන් දෙනෙකුත් කාන්තා බෝම්බ ඉවත් කරන්නන් පස් දෙනෙකුගෙන් හතර දෙනෙකුත් සිය මිලට ගැනීමේ හැකියාව වැඩි වී තිබුණු බවට හෝ ඇඩි ලෙස ඉහළ ගොස් තිබූ බවට එකඟ වූහ. කාන්තාවන්ගෙන් 89%ක් සහ පුරුෂයින්ගෙන් 77%ක් සිය රැකියාවේ සෘජු ප්‍රතිඵලයක් ලෙස ආහාර වෙත වන ප්‍රවේශය ඉහළ ගිය බවට වාර්තා කළහ. ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශ්වයේම හය දෙනෙකු සිය නළ ජලය වෙත වන ප්‍රවේශය පිළිබඳව වාර්තා කළහ.

අධ්‍යාපනය සඳහා වැඩි ප්‍රවේශයක් තිබෙන බවට වාර්තා කළ බෝම්බ ඉවත් කරන්නන්




වෙනත් බලපෑමක් වූයේ අධ්‍යාපනය වෙත වූ ප්‍රවේශයයි: බෝම්බ ඉවත් කරන කාන්තාවන් දහ දෙනෙකුගෙන් හත් දෙනෙකුත් පුරුෂයින් දහ දෙනෙකුගෙන් හය දෙනෙකුත් සිය දරුවන් පාසලේ ගත කළ අවුරුදු ගණන බොහෝ සෙයින් ඉහළ ගිය බව වාර්තා කළහ.

සෞඛ්‍යාරක්ෂණ සේවා සඳහා වැඩි ප්‍රවේශයක් තිබෙන බව වාර්තා කළ බෝම්බ ඉවත් කරන්නන්




අවසාන වශයෙන්, කාන්තාවන්ගේ සහ පුරුෂයින්ගේ සෞඛ්‍ය සේවා සඳහා වන ප්‍රවේශය සම්බන්ධයෙන් සමීක්ෂණය උනන්දුවක් දැක්වීය. බොහෝ අවධානයට යොමු වූ කරුණක් වූයේ, කාන්තාවන්ගෙන් 75%ක් සහ පුරුෂයින්ගෙන් 81%ක් සෞඛ්‍ය සේවා වෙත ඉහළ ගිය හෝ බොහෝ සෙයින් ඉහළ ගිය ප්‍රවේශයක් තිබූ බවය; අනුපිළිවෙලින් 74%ක් සහ 77%ක් ඖෂධ සහ වෛද්‍ය නිර්දේශ මත ලබා දෙන ඖෂධ සඳහා ඉහළ ප්‍රවේශයක් තිබෙන බවට වාර්තා කළහ.

## රැකියාවේ දී සමානයි, නමුත් නිවසේ බර දරයි

කාන්තාවන් සහ පුරුෂයින් උරෙනුර ගැටී වැඩ කරන සහ සමාන ප්‍රතිලාභ සහ ආදායම් ලැබෙන රැකියා ක්ෂේත්‍රවලින් එකක් ලෙස බෝම්බ ඉවත් කිරීමේ රැකියාව ප්‍රකටය. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල විධිමත් රැකියාවක ප්‍රතිලාභවලට අමතර අනෙකුත් දේවල් අතර, නියමිත වේලාවට වැටුප් ලැබීම සහ සමාන පදනමින් උසස් වීම් සඳහා ප්‍රවේශය හිමි වීම දැක්විය හැකිය.

වැටුප් ලැබෙන රැකියාවලට අමතරව වැටුප් නොලැබෙන ගෘහස්ත වැඩවලින් වැඩි කොටසක් කාන්තාවන් විසින් සිදු කළ යුතු බවට අපේක්ෂා කෙරේ. කාන්තා බෝම්බ ඉවත් කරන්නන්ට දෙගුණයක බරක් දැරීමට සිදු වන බව වාර්තා විය.[10] ඊට අමතරව, රැකියාවට යන විට බාල දරුවන් නිවසේ තනිව දමා ඒමට සිදු වීම සාකච්ඡාවට බඳුන් වූ විවාද සම්පන්න මාතෘකාවක් විය, එසේම නිවසේ දරුවන් සමග සිටීම වෙනුවට වැඩ කිරීම තෝරා ගතහොත් රැකියාවක් කරන සැමියෙකු විසින් එය සෘණාත්මකව දැකිය හැකි තත්ත්වයක් ද විද්‍යාමාන විය.


10 ‘දෙගුණයක බරක් දැරීම’ යන පදයෙහි අර්ථය වනුයේ ලෝකයේ සිටින කාන්තාවන් කුටුම්භයේ සහ ප්‍රජාවේ වැටුප් නොලබන රැකවරණ වැඩවලින් බහුතරයක් සඳහා වගකීම දරන අතරම ශ්‍රම වෙළඳපලේ පූර්ණකාලීන රැකියාවල යෙදීම යන්න අදහස් කෙකෙරේ.

## බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් ඔබ්බට ස්ත්‍රීත්වය හා බැඳුණු ප්‍රතිමාන වෙනස් කිරීම

කාන්තාවන් බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වූ අවස්ථාවේ පටන් සිය ආත්ම විශ්වාසය, ප්‍රයෝජනවත්භාවය, සහ අනෙක් අය සමග වන සම්බන්ධතාවය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය වඩා ධනාත්මක වී ඇති බවට ප්‍රබල සාක්ෂි එකතු කර ගැනීමට මෙම අධ්‍යයනයට හැකි වී තිබේ. සිය රැකියාව හේතුවෙන් දැඩි ආත්ම විශ්වාසයක් ඇති වී තිබෙන බවට කාන්තා බෝම්බ ඉවත් කරන්නන්ගෙන් 95%ක් කියා සිටියහ. මීට හේතු සාධක ලෙස මූල්‍ය වශයෙන් සවිබල ගැන්වීම, පවුල්වලට උපකාර කිරීමට හැකි වීම, නව කුසලතා ඉගෙනීම, සහ සිය ප්‍රජාවේ ආරක්ෂාවට දායක වීමට හැකි වීම පෙන්වා දිය හැකිය.


බෝම්බ ඉවත් කිරීමෙහි නිරත කාන්තාවන්ගෙන් 86%ක් කියා සිටියේ කුටුම්භය තුළ සිය අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් සිය ආත්ම විශ්වාසය වැඩි වී ඇති බව හෝ බොහෝ සෙයින් වැඩි වී ඇති බවය.

සිය කුටුම්භය තුළ අදහස් ප්‍රකාශ කිරීමට බෝම්බ ඉවත් කරන කාන්තාවන් සතු ආත්ම විශ්වාසය





බෝම්බ ඉවත් කරන කාන්තාවන් දහ දෙනෙකුගෙන් නව දෙනෙකු තමන්ට රැකියාව ලැබීමෙන් පසුව මූල්‍ය ස්වාධීනත්වය වැඩි වූ බව හෝ බොහෝ සෙයින් වැඩි වූ බවට වාර්තා කළ අතර 94%ක් ප්‍රකාශ කළේ කාන්තාවන්ට සිය පවුල්වලට මූල්‍ය වශයෙන් සහාය විය හැකි වීම සම්බන්ධයෙන් වැඩි විශ්වාසයක් ඇති බවය. ඊට අමතරව, කාන්තා ප්‍රතිචාරකයන්ගෙන් 98%ක් පිරිමින් ආකාරයටම කාන්තාවන් ද සේවා නියුක්ත කිරීමට හැකි වීම සම්බන්ධයෙන් වඩා ආත්ම විශ්වාසයක් පළ කළහ. බොහෝ දෙනෙකුට, පුරුෂයින් සමග උරෙනුර ගැටී වැඩ කරන ප්‍රථම අත්දැකීම මෙය විය. බෝම්බ හා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වීම සම්බන්ධයෙන් කාන්තාවන් සහ පුරුෂයින් බහුතරයක් ධනාත්මක අදහස් දැරූහ.

මූල්‍ය ස්වාධීනත්වය වාර්තා කරන බෝම්බ ඉවත් කරන කාන්තාවන්




බෝම්බ ඉවත් කරන්නියන් ලෙසට කාන්තාවන්ගේ සේවා නියුක්තිය, සාමාන්‍යයෙන් කාන්තාවන් සම්බන්ධයෙන් වන අපේක්ෂා වෙනස් කිරීම කෙරෙහි දායක වී තිබේ. බෝම්බ ඉවත් කරන කාන්තාවන් දහ දෙනෙකුගෙන් හත් දෙනෙකුට වැඩි සංඛ්‍යාවක්, ඔවුන්ගේ පවුල් සහ ප්‍රජා සාමාජිකයින් බෝම්බ ඉවත් කිරීමෙහි නිරත කාන්තාවන්, සහ සිය පවුල්වලට මූල්‍ය වශයෙන් සහාය දක්වන කාන්තාවන් දෙස වඩා ධනාත්මක ලෙස බැලීමට පටන් ගත්හ.

කාන්තාවන්ටද පිරිමින් ආකාරයටම රැකියාව කළ හැකි බවට පවුල්වල පිරිමින් වඩා විශ්වාසය පළ කළ බව වාර්තා කරන බෝම්බ ඉවත් කරන කාන්තාවන්




තම පවුල්වලට මූල්‍ය වශයෙන් උපකාර කරන කාන්තාවන් සම්බන්ධයෙන් පවුලේ පිරිමි සාමාජිකයන් වඩා ධනාත්මක ලෙස බලන බව වාර්තා කළ බෝම්බ ඉවත් කරන කාන්තාවන්





බෝම්බ ඉවත් කරන්නියන් වීමට කාන්තාවන් සතුව තිබිය යුතු කුසලතා සහ සුදුසුකම් මොනවා දැයි ඇසූ විට, පවුලේ සහ ප්‍රජා සාමාජිකයෝ බොහෝ විට කාන්තා බෝම්බ ඉවත් කරන්නියන් විස්තර කිරීමට 'නිර්භීත' යන වචනය භාවිතා කළහ. පවුලේ සහ ප්‍රජා සාමාජිකයින්ගේ අදහස වූයේ, බෝම්බ ඉවත් කිරීමේ කාර්යය සිදු කිරීම සඳහා කායික ශක්තියට වඩා චිත්ත ධෛර්යය වැදගත් වන බවය. බෝම්බ ඉවත් කරන කාන්තාවන් 'ගරුත්වයක්' සහ 'ස්වාධීනත්වයක්' ඇති අය බව පෙනී යයි.

## අත්පත් කරගත් නව කුසලතා සහ සේවා මුක්ත කිරීම


මෙම අධ්‍යයනය මගින් කලින් රැකියා අත්දැකීම්, සහ බෝම්බ හා ආශ්‍රිත ක්‍රියාකාරකම් තුළින් අත්පත් කරගත් කුසලතා පිළිබඳ දත්ත එකතු කරන ලදි. ඉදිරි වසරවල දී ශ්‍රී ලංකාව බෝම්බවලින් තොර රටක් බවට පත් වීම සම්බන්ධයෙන් මෙම දත්ත ප්‍රයෝජනවත් වන බවට සාක්ෂි ඇත. බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට ඔවුන් බඳවා ගැනීමට පෙර, සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලද පුරුෂ බෝම්බ ඉවත් කරන්නන්ගෙන් භාගයකටත් වඩා වැඩි ප්‍රමාණයක් දෛනික රැකියා, එනම් මේසන් වැඩ, පින්තාරු වැඩ, ඇඳුම් මැසීම, ආහාර පිසීම, සහ රිය පැදවීම වැනි රැකියාවල නිරතව සිටි බව සොයා ගන්නා ලදි. මේ අතරතුර, බෝම්බ ඉවත් කරන කාන්තාවන් දහ දෙනෙකුගෙන් හතර දෙනෙකුට ඔවුන් බෝම්බ ආශ්‍රිත රැකියා අත්දැකීමට පෙර ඔවුන් සේවය කළේ කුමන අංශයක දැයි කීමට නොහැකි විය. කාන්තාවන් තුනෙන් එකක් වත්මන් රැකියාවට පෙර කිසිදු ආදායමක් නොලැබූ අය බැවින් බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට පෙර ඔවුන් රැකියාවක් නොකළ අය විය හැකිය.

බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම් නොවේ නම් ඔවුන් වැඩ කිරීමට වඩාත්ම කැමති කුමන අංශයක දැයි යන්න ද අසන ලදි. කාන්තා සහ පුරුෂ ප්‍රතිචාරකයන්ගෙන් බොහෝ දෙනෙකු ප්‍රකාශ කළේ ඔවුන් කෘෂි කර්මාන්තයේ සේවය කිරීමට කැමති බවය.

අනෙක් අංශවල සේවය කිරීමට බෝම්බ ඉවත් කරන කාන්තාවන්ගේ කැමැත්ත



අනෙක් අංශවල සේවය කිරීමට බෝම්බ ඉවත් කරන පුරුෂයන්ගේ කැමැත්ත




බෝම්බ ඉවත් කරන්නන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කළේ ඔවුන් බෝම්බ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් විවිධ වූ කුසලතා අත්පත් කරගත් බවය. අත්පත් කරගත් කුසලතාවලට ඇතුළත් වනුයේ:

| කුසලතා | කාන්තා | පුරුෂ |
|---|---|---|
| කණ්ඩායම් වැඩ | 95% | 97% |
| නායකත්වය | 98% | 85% |
| ප්‍රථමාධාර | 90% | 90% |
| කළමනාකරණය සහ කාල කළමනාකරණය | 90% | 90% |
| සන්නිවේදන කුසලතා | 90% | 90% |
| භාෂා කුසලතා, විශේෂයෙන්ම සිංහල හෝ ඉංග්‍රීසි | 65% | 81% |
| පරිගණක කුසලතා | 50% | 60% |

සේවාමුක්ත කිරීමෙන් පසුව අනාගත රැකියා සඳහා වන හැකියා සම්බන්ධයෙන් මෙම දත්ත යොදා ගත හැකිය. විශේෂයෙන්ම, ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල ව්‍යාප්ත රැකියාවල අඩු කම අවධාරණයට ලක් වූ අතර, සේවා මුක්ත කිරීමෙන් පසුව කාන්තා ගෘහ මූලිකයන්ට අවදානම් සහගත ආර්ථික තත්ත්වයකට මුහුණ දීමට සිදු විය හැකිය. සිය පවුල් නඩත්තු කිරීම සඳහා නීති විරෝධී වැඩවල යෙදීමට ඔවුනට මෙයින් බලපෑමක් ඇති වීමට ඉඩ තිබේ. මෙම කාර්යභාරය අවසන් වීමට ආසන්න බැවින් කාන්තාවන්ගේ සහ පුරුෂයින්ගේ විවිධ අවශ්‍යතා සහ ඉඩප්‍රස්ථා සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු අතර සේවා මුක්ත කිරීම මුළුල්ලේම ස්ත්‍රී පුරුෂභාවය කෙරෙහි සැලකිල්ල ලබා දිය යුතුය.

**Geneva International Centre for Humanitarian Demining (GICHD)**
Maison de la paix, Tower 3, Chemin Eugène-Rigot 2C
PO Box 1300, CH – 1211 Geneva 1, Switzerland
info@gichd.org
gichd.org